**කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**

**දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය**

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2013/14

2017 අප්‍රේල් - ජූනි

මානවශාස්ත්‍ර පීඨය

බටහිර සම්භාව්‍ය සංස්කෘතිය - **WCCU – E 2015**

ග්‍රීක හා රෝම නාට්‍යය

ඕනෑම ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. කාලය : පැය 03 යි.

---

01. ඇගමෙම්නොන් හි (Agamemnon ) යුක්තිය නැමති තේමාව ඉදිරිපත් කිරීම සඳහා ඊස්කිලස් ක්ලයිටෙම්නෙස්ට්‍රා හා ඇගමෙම්නොන්ගේ චරිත කෙසේ භාවිත කරයි ද? සාකච්ඡා කරන්න.

02. තම රටවැසියන් තිබ්ස් හි දූෂිතයාගේ බලපෑමෙන් මුදා ගැනීම සඳහා ඊඩිපස් දරණ උත්සාහයේ අවංකභාවය කෙතරම් ඛේදනීය ද? සොෆොක්ලිස්ගේ **කිං ඊඩිපස්** (King Oedipus) ඇසුරින් සාක්ච්ඡා කරන්න.

03. **හිපොලිටස්** හි (Hippolytus) යුරිපිඩීස් ප්‍රේක්ෂකයා ඔලිම්පියානු දෙවියන්ගේ ස්වරූපය ප්‍රශ්න කිරීමට යොමුකරවන නාට්‍යකරුවකු ලෙස විමසන්න.

04. ඇරිස්ටොෆනිස්ගේ **ලයිසිස්ට්‍රාටා** හි (Lysistrata) ප්‍රේමය හා යුද්ධය යන බලවේග කෙස් නිරූපනය වී ඇත්ද? සාකච්ඡා කරන්න.

05. **බෑඩ් ටෙම්පර්ඩ් මෑන්** හි (Bad Tempered Man) ග්‍රීක නව කොමඩි ලක්ෂණ ඉදිරිපත් කිරීමේදී මිනැන්ඩර් දක්වන දක්ෂතාවය සාකච්ඡා කරන්න.

06. **පොට් ඔෆ් ගෝල්ඩ් හි** (The Pot of Gold) ප්ලෝටස් මානුෂික සබඳතාවයන්ට කුමන වැදගත්කමක් ආරෝපනය කරයි ද? සාකච්ඡා කරන්න.

07. **ටෙරන්ස්ගේ මදර් ඉන් ලෝ** හි ( Mother -in -law) ප්‍රේමය හා පවුල් ජීවිතය කෙතරම් වැදගත් වේ දැයි විමසන්න.

08. රෝමානු කොමඩි බිහිවූ සාමාජික හා ආගමික පසුබිම සාකච්ඡා කරන්න.

එක්කෝ

09. ඔබ හදාරා ඇති ග්‍රීක **හෝ** රෝම නාට්‍යයක් ඇසුරෙන් පහත දෑ විමසන්න.

1. එම නාට්‍යයේ භාවිතා වූ නාට්‍යමය උපක්‍රම
2. ඒවා වේදිකාව මත ඉදිරිපත් වූ රංගනයට බලපෑ ආකාරය

10. පහත සඳහන් මාතෘකාවන්ගෙන් **දෙකකට** (02) කෙටි සටහන් සපයන්න.

1. කැසැන්ඩ්‍රා
2. පැම්ෆිලුස්
3. ග්‍රීක ට්‍රැජඩි නාට්‍යවල කෝරසය
4. රෝම නාට්‍යවල වහලුන්

**********************